# මහ මැතිවරණයේදී ආණ්ඩු පක්ෂයට හා විපක්ෂයට සම අයිතීන් දිය යුතුයි

## පැෆරල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි

මව්බිම

**නුවන් හෙට්ටිආරච්චි**

මැතිවරණයේ සාර්ථකභාවය සඳහා ආණ්ඩු පක්ෂයට හා විපක්ෂ කණ්ඩායම්වලට සම අයිතීන් ලබා දිය යුතු බවත් ප්‍රචාරක කටයුතු සඳහා ප්‍රමාණවත් ඉඩක් ලබාදිය යුතු බවත් පැෆරල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි මහතා පවසයි.

එසේම වත්මන් ජනාධිපතිවරයා සංස්ථා සභාපතිවරුන් ඇතුළුව රාජ්‍ය නිලධාරීන් දේශපාලන කටයුතුවලට සම්බන්ධ වීම වැළැක්වීමට ගත් තීරණය අගය කරන බවත් හෙතෙම ‘මව්බිම’ට පැවැසීය.

මහ මැතිවරණයේදී අපේක්ෂකයන් සියලුම දෙනාටම කොරෝනා නිරෝධායන නීතිවලට යටත්ව සම අයිතීන් ලබාදෙමින් මහ මැතිවරණ ප්‍රචාරක කටයුතු සිදුකිරීමට ඉඩ ලබාදීම හා මැතිවරණ පැමිණිලි ඉතා කඩිනම්ව විභාග කිරීම සිදුකළ යුතු බවටත් පැෆරල් සංවිධානය රජයට අවධාරණය කරයි.